ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

"නිපුණතා පියස", 4 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05

දුරකථන අංක 011-2596516/17, 011-2598220

දිනය - 2026.10.27

කළමනාකරු

<u>සභාපති කාර්යාලය හා මානව සම්පත් හා පරිපාලන අංශයේ ඇති මාළු ටැංකි නඩත්තු කටයුතු සඳහා නව සේවා සපයන්නෙකු තෝරා ගැනීම</u>

සභාපති කාර්යාලය හා මානව සම්පත් හා පරිපාලන අංශයේ ඇති මාළු ටැංකි නඩත්තු කටයුතු සඳහා නව සේවා සපයන්නෙකු තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. ඔබ ආයතනයේ මුද්‍රා තබන ලද මිල ගණන් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන **2026.11.06** දින පෙ.ව. **10.30**ට පෙර ඉහත ලිපිනයෙහි සඳහන් ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. මිල ගණන් බහාලන කවරයේ වම් පස**"VTA/PROC/Service/TF/SM/2026/45/Fish Tank Maintenance"** සඳහන් කළ යුතුය. ලංසු විවෘත කිරීම **2026.11.06** දින පෙ.ව. **10.30**ට ඔබ හෝ ඔබ විසින් නම් කරන ලද බලයලත් නියෝජිතයකු ඉදිරිපිටදී එම ස්ථානයේදීම සිදු කිරීමට සැලසුම් කර ඇත.

<u>මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු</u>

1. ඔබ විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් වසරක කාලයක් සඳහා වලංගු විය යුතුය.
2. වර්ණවත් නඩත්තු කිරීමට පහසු ටැංකියේ ධාරිතාවයට සුදුසු මාළු හා නීරෝගී මාළුන් විය යුතුය.
3. ස්වභාවික ගල්, කෘතිම ගල්, සැරසිලි හා Algae යෙදිය යුතුය.
4. සතියකට වරක් ටැංකි පිරිසිදු කිරීම, ජලය 30%-50% අතර මාරු කිරීම.
5. පිල්ටර් පද්ධති, ඔක්සිජන් පොම්ප, ලයිට් පද්ධති සැපයීම හා නඩත්තු කිරීම.
6. මාළුන්ගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරීම, රෝගී මාළු ඉවත් කිරීම, අවශ්‍ය ඖෂධ යෙදීම.
7. Cleaner Fish (Pleco) ටැංකිය තුලට දමන්නේ නම් සුදුසු ආහාර යෙදීම හා එම සත්වයාද නිරීක්ෂණය කිරීම.
8. මාළුන්ට සුදුසු ආහාර ලබා දීම හා එම ආහාර සපයන ආකාරය පිළිබඳ අදාල අංශයේ නිලධාරීන්ට උපදෙස් දීම.
9. ටැංකිය තුල ජලය PH අගය, උෂ්ණත්වය නියමිත මට්ටමේ පවත්වාගෙන යාමට කටයුතු කිරීම.
10. මාළු මියගිය හොත් ඉවත් කිරීමට අදාල කටයුතු හා නව මාළුන් යෙදීම.
11. මාසිකව සේවා වාර්තාවක් ඉදිරිපත් කිරීම.
12. සේවයට අදාල උපකරණ හා ශ්‍රමය සේවා සපයන්නා විසින් සපයා ගතයුතු වීම.

<u>මිල ගණන් සමඟ ඉදිරිපත් කල යුතු ලේඛන</u>

1. මාළු ටැංකි සේවා සැපයීම හා නඩත්තුවට අදාලව ව්‍යාපාර ලියාපදිංචි සහතිකය.
2. වසර 03කට වැඩි සේවා පලපුරුද්දක් සනාථ කිරීමට අදාල ලේඛන ඉදිරිපත් කිරීම.

සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)

අංකය	අයිතමය	පිරිවිතර	ප්‍රමාණය	ඒකකයක වටිනාකම	බදු	මුළු වටිනාකම
1	සභාපති කාර්යාලයේ මාළු ටැංකිය (ප්‍රමාණය - 5 1/2 x 1 1/2)	මාළුන් සමඟ සැරසිලි සැපයීම මාසක කාලයක් සඳහා	1			
		මාසික නඩත්තු ගාස්තුව (මාළු කෑම හා බෙහෙත් වර්ග ඇතුලුව)				
2	මානව සම්පත් හා පරිපාලන අංශයේ මාළු ටැංකිය (ප්‍රමාණය - 2 1/2 x 1 1/2)	මාළුන් සමඟ සැරසිලි සැපයීම මාසක කාලයක් සඳහා	1			
		මාසික නඩත්තු ගාස්තුව (මාළු කෑම හා බෙහෙත් වර්ග ඇතුලුව)				
මුළු වටිනාකම						

දිනය :

අත්සන සමඟ මුද්‍රාව: